**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව**

**සති පාසල**

**විෂය - පෙරදිග සංගීතය**

**ශ්‍රේණිය - 9**

**සැප්තැම්බර් මාසය - 2 සතිය**

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති

ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1: ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 1.1.1 : කාෆි රාගයේ සර්ගම්

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 හා ,03 පැවරුම් සම්පූර්ණ කරන්න.

පැවරුම 01 - i. කාෆි රාගයට අයත් පහත සඳහන් සර්ගම් ගීත ගායනය හොඳින් ශ්‍රවණය කරන්න.

https://youtu.be/2HbvvVk5gok

කාෆි රාගයේ දාදරා තාලය මත නිර්මාණය වූ සර්ගම් ගීතයක් ද ඔබට පහත සබැඳිය ඔස්සේ ශ්‍රවණය කළ හැකි වේ. https://youtu.be/SYcGewVd8EU

ii. සර්ගම් ගීතය නිර්මාණයේදී විකෘති ස්වර දෙකක් පමණක් යෙදී ඇති ආකාරය පිරික්සන්න.

iii. කාෆි රාගයට අයත් සර්ගම් ගීතය පහත ඇක්වෙන අයුරින් නිවැරදිව අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

iv. හැකි නම් ස්වර පුවරුවක් ආධාරයෙන් හෝ ඉහතින් ඔබට ලබා දී ඇති link ආධාරයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීතය ගායනයට හුරු වන්න.

කාෆි රාගය - සර්ගම් ගීතය - ත්‍රී තාල

| | | | |
|---|---|---|---|
| 0<br>ස ස රි රි<br>නි ධ ප ම | 3<br>ග ග ම ම<br>ග ග රි රි | x<br>ප - - ම<br>රි ප ම ප | 2<br>ප ධ නි ස්˚<br>ම ග රි ස |
| ම ම ප ධ<br>ධ ධ ප ප<br>නි ධ ප ම | නි නි ස්˚ -<br>ප ධ ප ම<br>ග ග රි රි | රි˚ ග˚ රි˚ ස්˚<br>ප - - ම<br>රි ප ම ප | නි ධ නි -<br>ප ධ නි ස්˚<br>ම ග රි ස |

පැවරුම 02 (ලිඛිත) - පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කාෆි රාගයට අයත් ආරෝහණ අවරෝහණ ලියන්න.

ii. මෙම රාගයේ යෙදෙන විකෘති ස්වර මොනවාද?

iii. කාෆි රාගයේ අනුවාදී ස්වර මොනවාද?

iv. සර්ගම් ගීත ගායනයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

පැවරුම 03

i. e තක්සලාව, e නැණපියස වෙබ් අඩවි වෙතින් කාෆි රාගයට අයත් ශාස්ත්‍රීය ගායන වාදන පරිශීලනයට යොමුවන්න.